කෘතවේදී

# ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ
# අභිනන්දන ග්‍රන්ථය

## Kṛitavedi
## Festschrift for Senior Professor Piyadasa Ranasinghe



# කෘතවේදී : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය

# Kritavedi : Festschriftਂ for Senior Professor Piyadasa Ranasinghe

**සංස්කරණ උපදේශනය**

මහාචාර්ය එම්. පී. සතිජා
මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න

**Consultant Editors**

Professor M.P. Satija
Professor A.H.M.H. Abayarathna

**සංස්කාරකවරු**

ලැගුම්දෙණියේ පියරතන හිමි
මහාචාර්ය ඩබ්ලිව්. ඒ. වීරසූරිය
ආර්.ඩී. ආනන්ද තිස්ස

**Editors**

**Rev. Legumdeniye Piyarathana**
**Professor W.A. Weerasooriya**
**R.D. Ananda Tissa**

2014

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාව: ඉතිහාසය හා විකාශනය

ආර්. ඒ. ඒ. එස්. රණවීර


## සාරාංශය

*ශ්‍රී ලංකාවේ වර්තමාන පුස්තකාල ඉතිහාසය 19 වන සියවසේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ආරම්භ කළ 'දායක පුස්තකාල' (Subscription Libraries) සහ කියවීම් ශාලා (Reading Rooms) නැමැති සංකල්පයන් සමග ආරම්භ විය- මෙරට සේවය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන්ට කියවීමේ හා විනෝදාස්වාදය සැපයීමේ අරමුණින් මෙම දායක පුස්තකාල ආරම්භ කරන ලදී.*

*19 වන සියවස මැද භාගය වනවිට ත්‍රිකුණාමලය, යාපනය, කළුතර, මාතර, කුරුණෑගල, කෑගල්ල, ගම්පොළ, මන්නාරම, හැටන්, නුවරඑළිය, ගාල්ල හා මහනුවර යනාදී ප්‍රධාන නගර රැසක් ආවරණය කරමින් දායක පුස්තකාල පද්ධතියක් ලංකාව තුළ ක්‍රියාත්මක විය.*

*20 වන සියවස මුල්භාගය වනවිට දායක පුස්තකාල ස්ථාපනය කිරීමේ මූලික අරමුණ වෙනස් වූ අතර මෙම දායක පුස්තකාල පොදු මහජනතාව සඳහා ද විවෘත විය. දායක පුස්තකාල සම්බන්ධයෙන් මහජනතාව තුළ පැවති ආකල්ප හා පුස්තකාල භාවිතය පිළිබඳ ව මහජනතාව තුළ පැවති ආකල්ප හා උනන්දුව මේ සඳහා විශේෂයෙන් ම බලපෑ හේතු සාධක ලෙස සඳහන් කළ හැකිය.*

*මහනුවර මෙයාම නගර පුස්තකාලය සහ 1925 දී කොළඹ මහජන පුස්තකාලය ආරම්භ කිරීම ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස සඳහන් කළ හැකිය.*

*නිදහස ලබා ගැනීමෙන් පසු යුගය තුළ දී ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතියේ ප්‍රගමනයක් සිදු වූ අතර නිදහස් අධ්‍යාපනය සහ සිංහල රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීම මේ සඳහා ඉවහල් වූ ප්‍රධානතම සාධක වේ.*

*වර්තමානයේ දී ලංකාව පුරා විසිරී ගිය මහජන පුස්තකාල දැකිය හැකිය- එහෙත් වර්තමාන මහජන පුස්තකාල සේවාව දෙස බලන විට පෙනී යන්නේ එහි සංවර්ධනය තරමක් මන්දගාමී ස්වරූපයකින් පවතින බවයි.*

*මහජන පුස්තකාල සේවාවේ වඩාත් ඵලදායී හා ගුණාත්මක වර්ධනයක් දැකිම තරමක් අසීරු කරුණක් ලෙස සඳහන් කළ හැකිය. මේ සඳහා හේතු සාධක රැසක් බලපෑ අතර ගුණාත්මක මහජන පුස්තකාල සේවාවක් මහජනතාව වෙත ලබා දීමට නම් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ව්‍යුහය වෙනස්කම් කිහිපයකට භාජනය කිරීම කඩිනමින් කළ යුතුය.*


**ප්‍රමුඛ පද :** මහජන පුස්තකාල, දායක පුස්තකාල, පුස්තකාල ඉතිහාසය, මහජන පුස්තකාල ව්‍යාපාරය, කොළඹ මහජන පුස්තකාලය

## මුල් යුගය

ශ්‍රී ලංකාවේ වර්තමාන පුස්තකාල ඉතිහාසය පිළිබඳ විමර්ශනය කිරීමේ දී ගම්‍ය වන කරුණක් වනුයේ එය බ්‍රිතාන්‍ය යුගය කරා දිව යන බවයි. බ්‍රිතාන්‍යයන්ගේ ශ්‍රී ලාංකීය ආගමනය සිදු වූයේ 1796 දීය. 1815 දී කන්ද උඩරට රාජධානිය යටත්කර ගැනීමත් සමග ම ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට සම්පූර්ණයෙන් ම නතුවිය. එම යටත් වීමත් සමග ම දේශපාලන, ආර්ථික, ආගමික හා සාමාජීය වශයෙන් විශාල වෙනස්කම් රැසක් ලාංකික සමාජය තුළ සිදු විය. ශ්‍රී ලංකාවේ වර්තමාන පුස්තකාල ඉතිහාසය පිළිබඳ සාහිත්‍ය විමර්ශනය කිරීමේ දී පෙනී යන්නේ 19 වන සියවසේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ආරම්භ කරන ලද 'දායක පුස්තකාල' (Subscription Libraries) සහ කියවීම් ශාලා (Reading Rooms) සංකල්පයන් සමග වර්තමාන පුස්තකාල ආරම්භ වූ බවයි. මෙරට සේවය කළ බ්‍රිතාන්‍ය